# පරිසරය හා සංවර්ධනය පිළිබඳ රියෝ සමුළුව

පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව 1992 ජුනි 01 වන දින සිට 14 වන දින දක්වා බ්‍රසීලයේ රියෝ ද ජනෙයිරෝ නගරයේ දී පවත්වන ලදී.

එහි න්‍යාය පත්‍රයට අඩංගු වූ ප්‍රධාන අංශ පහත සඳහන් වෙයි.

- 21 වන න්‍යාය පත්‍රය
- රියෝ ප්‍රකාශනය
- වන විද්‍යා ප්‍රතිපත්ති

න්‍යාය පත්‍රයෙහි අඩංගු කරුණුවලට අමතරව ඉහත දී පවත්වන ලද අන්තර් රාජ්‍ය කාරක සභා රැස්වීම් මට්ටමේදී සැලසුම් කරන ලද ජාත්‍යන්තර සම්මුති දෙකක් ද අත්සන් සඳහා නියෝජිත පිරිස ඉදිරියේ තබන ලදී.

මේවා නම්

- දේශගුණික වෙනස්කම් පිළිබඳ සම්මත කරගත් වැඩ සටහන් රාමුව.
- ජීව විද්‍යාත්මක විවිධතා සුරක්ෂිත කිරීම පිළිබඳ සම්මුතිය.

## 21 වන න්‍යාය පත්‍රය

21 වන න්‍යාය පත්‍රය පරිච්ඡේද 40 කින් යුක්ත ලේඛනයකි. මෙම ශත වර්ෂයෙහි ඉදිරි වසර ගණනාවෙහි මෙන්ම 21 වන ශත වර්ෂයෙහි ද, දැනට පවතින පරිසර පරිහානිකාරක ප්‍රවණතාවන් නිවැරදි කර ගනිමින් ධරණීය සංවර්ධනය කරා යොමුවීමට නම් ලෝකයේ සියලු රටවල් අනුගමනය කළ යුතු පාරිසරික හා සංවර්ධන ක්ෂේත්‍ර රාශියක් ඉන් ආවරණය වෙයි. දුප්පත්කම තුරන් කරලීම මනුෂ්‍යයාගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම සහ වැඩි දියුණු කරලීම, වෙනස් වන පරිභෝජන රටා ආදිය 21 වන න්‍යාය පත්‍රය මගින් ආවරණය වෙයි. මූලිකවම, ආර්ථික සම්පත් සහ තාක්ෂණය යන ප්‍රශ්න සැලකිල්ලට ගනිමින් යෝජිත වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රම ද මේ මගින් දැක්වෙයි.

## රියෝ ප්‍රකාශනය

මෙය පරිසරය හා සංවර්ධනය සම්බන්ධ මූලික ප්‍රතිපත්ති, උදාහරණ වශයෙන් සංවර්ධනය කරා යෑමේ දී තම සම්පත් උපයෝගී කර ගැනීමට රාජ්‍යයක් සතු පූර්ණ අයිතිය, දුප්පත්කම තුරන් කරලීමේ අත්‍යවශ්‍ය කාර්යය සඳහා සියලු රාජ්‍යයන් සහයෝගය දැක්විය යුතු බව, අන්තර්ජන ශක්ති වර්ධනයෙහි අවශ්‍යතාව ආදිය අඩංගු පොදු ප්‍රකාශනයකි.

## වන විද්‍යා ප්‍රතිපත්ති

මෙය සියලු රටවලට අදාළ වන පොදු වන විද්‍යා ප්‍රතිපත්ති අඩංගු ලේඛනයකි. සමහර රටවල සුරංකෑමට ලක්විය හැකි සම්පතක් බවට පත්විය හැක්කක් වන්නාසේම, ජීව විද්‍යාත්මක විවිධතා සුරක්ෂිත කරන්නා වූත්, ලෝක පරිසරය ස්ථාවරත්වයට එක් කරන්නා වූත් සම්පතක් වශයෙන් කැලෑවල ඇති වැදගත්කම සලකා බලා මෙම අංශය න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇත.

## දේශගුණික වෙනස්කම් පිළිබඳ සම්මත කරගත් වැඩ සටහන් රාමුව

පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු භාර ගරු ඇමතිතුමා විසින්, 1992 ජුනි මස 10 වන දින රියෝ නගරයේ දී මෙම සම්මුතියට අත්සන් තබන ලදී. මෙම සම්මුතිය, ලෝකය පුරාම හරිතාගාර වායු විමෝචන අඩු කිරීම පිළිබඳ වැඩ සටහනක් ඉදිරිපත් කරයි. ශ්‍රී ලංකාවෙහි මෙලෙස වායු නිපදවීම ඉතාමත් අඩු වුව ද මුහුදු මට්ටමේ නැගීම නිසා තදබල ප්‍රතිඵල අපට විඳීමට සිදුවිය හැකියි. මේ නිසා මිහිතලය උණුසුම්වීම පිළිබඳ ගැටළු සලකා බලන සම්මුතියක් අපට වැදගත් වෙයි.

## ජීව විද්‍යාත්මක සම්පත් සුරැකීමේ සම්මුතිය

සිංහරාජ වනය වැනි ප්‍රදේශ මෙන් ප්‍රාදේශීයව ඇති තුරුලතා හා සත්ව වර්ගවලින් පොහොසත් රටක් වන හෙයින්, ශ්‍රී ලංකාවේ වසන අපට මෙම සම්මුතිය වැදගත් වෙයි. ජීව විද්‍යාත්මක විවිධතා සුරක්ෂිත කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රම සහ ප්‍රකාශ මෙම සම්මුතිය ඉදිරිපත් කරයි. පාරිසරික හා පාර්ලිමේන්තු කටයුතු භාර ගරු ඇමතිතුමා විසින් 1992 ජුනි මස 10 වන දින රියෝ නගරයේ දී මෙම සම්මුතියට අත්සන් තබන ලදී.